මුන්දලම මද්‍රසා පාසලේ ඉගැන්වීම් සඳහා යොදාගත් ග්‍රන්ථ අන්තර්ගතයන් සම්බන්ධයෙන් සොයා බලා වාර්තාවක් ලබාදෙන ලෙසට කොළඹ කොටුව මහේස්ත්‍රාත් වරයා විසින් රිජ්වේ ආර්යා ළමා රෝහලේ අධ්‍යක්ෂකවරයාට සිදුකළ නියෝගය සම්බන්ධයෙන් පුවත් වාර්තාවන් පළ වී තිබිණි. මෙහිදී අවධානයට ලක් වූ කරුණක් වූයේ, මේ වන විට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන රඳවා තබාගෙන සිටින නීතිඥ හිජාස් හිස්බුල්ලා සම්බන්ධයෙන් මෙම පුවත් වාර්තාවන් තුළ දැක්වුණු ආකාරයයි.

මෙම ඇතැම් පුවත් වාර්තාවන්හි නීතිඥ හිජාස් හිස්බුල්ලා විසින් අදාළ මද්‍රසා පාසල පවත්වාගෙන ගිය බව වාර්තා වේ යනුවෙන් දැක්වුණු අතර, තවත් පුවත් වාර්තාවන්හි සිරස්තල තුළම නීතිඥ හිජාස්ගේ මද්‍රසා පාසල යනුවෙන්ද සඳහන්ව තිබිණි. කෙසේ වෙතත් මෙම මද්‍රසා පාසල පවත්වා ගෙන ගොස් ඇත්තේ නීතිඥ හිජාස් හිස්බුල්ලා යැයි තහවුරු වූයේ කෙසේද යන වගට කිසිදු මූලාශ්‍රයක් මෙම එකදු පුවත් වාර්තාවක් තුළ හෝ අන්තර්ගත නොවුණි. එසේ නම්, තවමත් පරීක්ෂණ පැවැත්වෙන මෙම සිදුවීම සම්බන්ධයෙන් මෙවන් නිගමනයන්ට අදාළ මාධ්‍ය පැමිණ ඇත්තේ කෙසේද? ඒ සම්බන්ධයෙන් නිශ්චිත මූලාශ්‍ර පදනමක් තිබෙන්නේද?
#MediaEthicsSL #lka #SinhalaPress #News #Aruna #Dinamina #Divaina #Mawbima